**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

பொலிஸ் ஊடகப் பிரிவு

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.08 පැය 1525 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/34 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

## 2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත යටතේ ආදයම් වියදම් වාර්තා භාර නොදුන් අපේක්ෂකයින් සම්බන්ධයෙන් නෛතික කටයුතු ආරම්භ කිරීම - පොලිස් මූලස්ථානය.

2023 අංක 03 දරණ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ප්‍රකාරව මැතිවරණයක ප්‍රතිඵල නිකුත් කර දින 21 ක් ඇතුළත පිළිගත් දේශපාලන පක්ෂයේ / ස්වාධීන කණ්ඩායමේ හෝ අපේක්ෂකයාගේ ආදයම් හා වියදම් සම්බන්ධව වාර්තා මැතිවරණ කොට්ඨාසයේ තේරීම් භාර නිලධාරියා වෙත භාර දීම සිදු කළ යුතු බව සඳහන් කර ඇත.

නමුත් ඉහත ප්‍රතිපාදන ප්‍රකාරව 2024 මහ මැතිවරණය හා අනුගත මැතිවරණ ආදයම් වියදම් වාර්තා භාර දීම සිදු කළ යුතු නමුත් එම වාර්තා මෙතෙක් භාර දීමට ක්‍රියා නොකරන ලද අපේක්ෂකයින් 1042 ක ගේ සහ පක්ෂ ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් 197 දෙනෙකු සම්බන්ධයෙන් විස්තර වාර්තාවක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පොලිස්පතිතුමා වෙත යොමු කර ඇත.

එම වගඋත්තර කරුවන්ට අදාළ මැතිවරණ කොට්ඨාස වලට අයත් පොලිස් කොට්ඨාසයන්හි කොට්ඨාස අපරාධ විමශර්ණ කායර්ාංශ මඟින් නියෝජ්‍ය පොලිස්පති නීති දිසාවගේ අධීක්ෂණය යටතේ විමශර්න ආරම්භ කිරීමට පොලිස්පති තුමා විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව කොට්ඨාස භාර නිලධාරීන් විසින් 2025.01.31 වන දිනට ප්‍රථම එකී විමශර්න වලට අදාළ උධෘත සකස් කොට නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කිරීමට පොලිස්පති තුමා විසින් සියළුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා කොට්ඨාස භාර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**